සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2020
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: නර්තනය (දේශීය) | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 01 |

උපදෙස් :

(i) සියලු ම සිසුන් **I** කොටසේ මුල් ප්‍රශ්න 30ට ම අනිවාර්යයෙන් ම පිළිතුරු සැපයිය යුතු ය. එයට අමතරව **II** උඩරට නර්තනය හෝ **III** පහතරට නර්තනය හෝ **IV** සබරගමු නර්තනය යන කොටස් තුනෙන් එක් කොටසකට පමණක් අංක 31 සිට 40 තෙක් පිළිතුරු සැපයිය යුතුය.

(ii) **ii, iii** හා **iv** වන කොටස් වලින් අංක 31 සිට 40 තෙක් මිශ්‍ර ව ප්‍රශ්න තෝරා නො ගත යුතු ය. ඔබ පිළිතුරු සපයන්නේ කුමන කොටස දැයි පිළිතුරු පත්‍රයේ පැහැදිලි ව ලියා දැක්විය යුතු ය.

(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

(iv) **I** ප්‍රශ්න පත්‍රයේ පිළිතුරු **II** පත්‍රයේ පිළිතුරු සමඟ අමුණා භාර දෙන්න.

උපදෙස් :-

(i) සියලු ම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවලට දී ඇති (1) (2) (3) (4) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

---

(01) මූලික සරඹ අභ්‍යාස කිරීමේදී දෙගුණ වශයෙන් හඳුන්වනුයේ ..................................................ලයට නැටීමය.

(1) ද්‍රැත  (2) විලම්භ  (3) මධ්‍ය  (4) කඩිනම්

(02) ''වමත සුරත නලලේ අළු ගාගෙන...'' මෙම කවි පද කොටසින් .................................................. ගේ චරිත ස්වභාවය විස්තර වේ.

(1) ආඬි ගුරු  (2) සොකරි  (3) පරයා  (4)සොත්තා

(03) සිංහල බෞද්ධ ජනයා තුණුරුවන් මුල්කරගෙන ගායනා කරන ලද .................................................. කවි සැම ශාන්තිකර්මයකම භාවිතා වේ.

(1) සවිදම්  (2) සිරසපාද  (3) වන්දමානම්  (4) නමස්කාර

(04) වන්නම් .................................................. ලක්ෂණයන්ගෙන් යුත් නර්තන අංගයකි.

(1) නෘත්‍ය  (2) නාට්‍ය  (3) නෘත්ත  (4)භාවාත්මක

(05) උඩැක්කියේ ආකෘතියට සමානව නිර්මාණය කර ඇති .................................................. නමැති වාද්‍ය භාණ්ඩය කරේ එල්ලාගෙන කෝටුවකින් වාදනය කරයි.

(1) චෙන්ඩාව  (2) එඩැක්ක  (3) ඩැක්කිය  (4) චෙංගිලම්

(06) රංගවස්ත්‍රාභරණ, වේශනිරූපණය හා ආලෝකකරණය සතර අභිනයෙන් .................................................. අභිනයට අයත් වේ.


(1) සාත්වික  (2) ආංගික  (3) ආහාර්යය  (4) වාචික

(07) 'ශම' නැමැති ස්ථායිභාවයෙන් ජනිත වනුයේ .................................................. රසයකි.
(1) ශාන්ත (2) කරුණා (3) අත්භූත (4) ශෘංගාර

(08) 1961 වර්ෂයේදී නිර්මාණය වූ, අග්‍රගන්‍ය කලාකෘතියක් ලෙස ..................................................මුද්‍රා නාට්‍ය පෙන්වාදිය හැකිය.
(1) නලදමයන්ති (2) රාමසීතා (3) චණ්ඩාලිකා (4) කරදිය

(09) ''රනේ රුවසෙ වත රුවින් දිලේ දෝ..''මෙය .................................................. කවි ගායනය.
(1) හටන් (2) මෝල්ගස් (3) ග්‍රහපත්ති (4) ප්‍රශස්ති

(10) මිශ්‍ර නර්තන අංගයකට වඩාත් උචිත ගැමි නැටුමකි,
(1) පතුරු (2) කළ (3) මෝල්ගස් (4) කුළු

(11) 
මෙම රූපයෙන් දැක්වෙන්නේ,
(1) සීබඩ් ඩයස් මහතා
(2) නිමල් වෙල්ගම මහතා
(3) රොබට් නොක්ස් මහතා
(4) රවීන්ද්‍රනාත් තාගෝර් මහතා

(12) විමලධර්මසූරිය රජු කල ලංකාවට පැමිණි දේශ ගවේශකයෙකි,
(1) ස්පිල්බර්ජන් (2) පාහියන් (3) ජෝන් ඩේවි (4) ඉබන් බතූතා

(13) ප්‍රස්තාරකරණයේදී ලඝු අක්ෂරයක් සමග හල් අකුරක් එකතු වීම හඳුන්වන්නේ,
(1) ගුරු මාත්‍රා නමිනි. (2) ප්ලුත මාත්‍රා නමිනි.
(3) හලන්ත ගුරු මාත්‍රා නමිනි. (4) සැදෑස්මත් නමිනි.

(14) නර්තන අධ්‍යාපනයේ ප්‍රවර්ධනයට දායක වූ ශිල්පිණියක් ලෙස නම් කළ හැක්කේ,
(1) වජිරා චිත්‍රසේන මහත්මිය (2) මිරැන්ඩා හේමලතා මහත්මිය
(3) චන්ද්‍රලේඛා පෙරේරා මහත්මිය (4) මේරියන් ද සේරම්

(15) කතකලි නර්තන ශිල්පියා විසින් කරනු ලබන මූලික අංග රචනය හඳුන්වන්නේ,
(1) තාඩි (2) කත්ති (3) ඩෙප්පු (4) පච්ච

(16) අංග රචනයක් කිරීමේදී මුලින්ම අවධානය යොමු කරන කොටස වනුයේ,
(1) නළලයි (2) නාසයයි (3) නිකටයි (4) දෙඇසයි

(17) කුඩාගුරු, මහාගුරු යන චරිත දෙකක් ඇසුරින් එන සංවාද සහිත නාට්‍යමය පෙළපාලියකි.
(1) ගබඩා කොල්ලය (2) මුවමල විදීම
(3) ගුරුගේ මාලාව (4) ගරා වෙස් පැම

(18) මාත්‍රා 2+2+4 තාල රූපය හඳුන්වන්නේ,

(1) දෙසුළු මහ තුන්තිත ලෙසය (2) දෙසුළු මැදුම් තුන්තිත ලෙසය

(3) සුළු මැදුම් මහ තුන්තිත ලෙසය (4) දෙමැදුම් මහ තුන්තිත ලෙසය

(19) පංච තූර්ය වර්ගීකරණයේදී ආතත හා විතත කාණ්ඩයට අයත් වේ,

(1) ගැටබෙරය හා දවුල (2) උඩැක්කිය හා බුම්මැඩිය

(3) ගැටබෙරය හා උඩැක්කිය (4) උඩැක්කිය හා තම්මැට්ටම

(20) දුනුමාලප්පුව නැටීමේ දී යොදා ගැනෙන රංග භාණ්ඩයකි,

(1) දුන්න (2) කෝලායුධය (3) දුන්න හා ඊ තළය (4) පොල් මල

ප්‍රශ්න අංක 21 සිට 23 තෙක් නිවැරදි පිළිතුර පහත වගුව ඇසුරින් තෝරන්න.

| පේළිය | A තීරුව | B තීරුව | C තීරුව |
|---|---|---|---|
| 1 | ගණිතාලංකාර | අස්නය | පොල් මල |
| 2 | ගැටිය | හරණ ගණිතයා | ඉල්ලම් මුදු |
| 3 | පුහුල | රම්මොලවක | හත් පදය |

(21) දවුල් බෙරයේ දක්නට ලැබෙන සුවිශේෂ කොටස් ඇතුලත් වන්නේ,

(1) 1 පේළියේ A හා C තීරුවලය (2) 2 පේළියේ A හා C තීරුවලය

(3) 1 පේළියේ B හා C තීරුවලය (4) 3 පේළියේ A හා C තීරුවලය

(22) උඩරට වන්නම් හා පහතරට සින්දු වන්නම් රචනා කරන ලද පුද්ගල නාමයන් සඳහන් වන්නේ,

(1) 1 පේළියේ A තීරුවේ හා 3 පේළියේ B තීරුවේය

(2) 2 පේළියේ B තීරුවේ හා 3 පේළියේ B තීරුවේය

(3) 1 පේළියේ A තීරුවේ හා 2 පේළියේ B තීරුවේය

(4) 3 පේළියේ B තීරුවේ හා 1 පේළියේ A තීරුවේය

(23) දැල් වූ පොල් පන්දම රංග උපකරණය ලෙස යොදා ගනිමින් කරන නර්තන අංගය ඇතුලත් වනුයේ,

(1) 1 පේළියේ B තීරුවේය (2) 1 පේළියේ C තීරුවේය

(3) 3 පේළියේ C තීරුවේය (4) 2 පේළියේ A තීරුවේය

(24) ශිල්පීය දක්ෂතා ප්‍රදර්ශනය කරන වාදන අවස්ථාවකි.

(1) පිං බෙර වාදනය (2) අත්‍යා බෙර වාදනය

(3) මගුල් බෙර වාදනය (4) පූජා බෙර වාදනය

(25) සම්ප්‍රදායන් තුනෙහිම ශාන්ති කර්ම වලදී භාවිතා කරන සැරසිලි අංගයකි.

(1) යහන (2) තොරණ (3) කාලපන්දම් ගස (4) බිසෝකප

(26) පහන්මඩු ශාන්ති කර්මයට පමණක් සුවිශේෂ වූ නාට්‍යමය අංගයකි.

(1) ඇත්බන්ධනය (2) මී බන්ධනය (3) අසුර යක්කම (4) අඹ විදමන

(27) සම්ප්‍රදායන් තුනෙහිම එකම අරමුණින් සිදු කරන චාරිත්‍ර වන්නේ,
(1) කප් සිටුවීම හා අයිලෙ යැදීම (2) කප් සිටුවීම හා මඩු පේ කිරීම
(3) මඩුපේ කිරීම හා නානුමුර කිරීම (4) මලපේ කිරීම හා අයිලෙ යැදීම

(28) චෙන්ඩා සහ මද්දලම් ප්‍රධාන වාද්‍ය භාණ්ඩ ලෙස යොදා ගන්නා නර්තන සම්ප්‍රදාය,
(1) උත්තර භාරතයේ කථකලි (2) දක්ෂිණ භාරතයේ කථකලි
(3) උත්තර භාරතයේ කථක් (4) දක්ෂිණ භාරතයේ කථක්

(29) භරත නර්තන සම්ප්‍රදායේ මූලික අංගහාරය හඳුන්වන්නේ,
(1) මැණ්ඩිය නමිනි (2) අරමණ්ඩිය නමිනි
(3) ගී මණ්ඩිය නමිනි (4) මුළු මණ්ඩිය නමිනි

(30) භරත නර්තන සම්ප්‍රදායේ පාද හුරුකර ගැනීම සඳහා අභ්‍යාස කරනුයේ,
(1) මණ්ඩි අඩව් (2) ගුදිත්ත මෙට්ට අඩව්
(3) නාට් අඩව් (4) තට් අඩව්

## II කොටස - උඩරට නර්තනය

(31) නම වන ගොඩ සරඹයේ සරඹ නාමය වනුයේ,
(1) ඇල සරඹයයි (2) අර්ධචක්‍ර සරඹයයි
(3) දැල සරඹයයි (4) දැත පෑගීමේ සරඹයයි

(32) ''දොං ජිං ජිං..'' මෙම බෙර පදයේ ඉතිරි කොටස වන්නේ
(1) ජිං ගජිගත (2) ජිංත කිටිතක
(3) තකට දොංතකු (4) තක්කඩ කඩතක

(33) ''ජිං තත් තත් ජිං කුද කුද...'' යන අලංකාර බෙර පදය වාදනය කළ හැකි තාලරූපය වනුයේ,
(1) මාත්‍රා 3+3 තාලය (2) මාත්‍රා 2+2 තාලය
(3) මාත්‍රා 3+4 තාලය (4) මාත්‍රා 2+3 තාලය

(34) කුදංත ගත දොං වට්ටමේ තාල රූපය වනුයේ,
(1) මාත්‍රා 2+2+3 තාලය (2) මාත්‍රා 3+3+4 තාලය
(3) මාත්‍රා 2+2+4 තාලය (4) මාත්‍රා 4+4 තාලය

(35) ''තාකු ................. තරිකිට, තකුද .................'' යන අඩව්වෙහි හිස්තැන්වලට ගැලපෙන පද කොටස් තෝරන්න.
(1) තක්කුං, තත්ජෙං (2) තක්කඩ, තරිකිට
(3) තක්කුං, ජෙංතා (4) කඩතක, තත්ජෙං

(36) ගැටබෙරයෙන් වාදනය කරනු ලබන පළමු හා දෙවන බෙර සරඹ වනුයේ,
(1) තක්කඩ - කුදට (2) තකට - තකට කුදට
(3) කුදට - තකට තකට කුද (4) තරිකිට - ජික්කඩ

(37) මාත්‍රා 2+4 දෙතිතට අයත් කස්තිරමක් ඇතුලත් වරණය කුමක්ද?

(1) ජෙං තත් තත් /// ජෙංතා
(2) තත් තකට තක රොං
(3) කුද ගජිගත /// කුද තා
(4) කුද ගජිත /// කුද තා

(38) ''හිරුත් අවර ගිරත් පැමිණි..'' මෙම කවි පදයෙහි ඉතිරි කොටස වනුයේ,

(1) විටත් ඔවුන තුටත් සිතින
(2) කලක් වසන තැනින් දුවන
(3) පිටත් පොට ගසා පනිමින
(4) මහත් සමගියෙන් දුව පැන

(39) සුප්‍රකට නර්තන ශිල්පිනී චන්‍ද්‍රලේඛා මහත්මියගේ බෙර වාදන ශිල්පියා හැටියට කටයුතු කළේ,

(1) එස්, පණිභාරත මහතාය
(2) විල්සන් ඔලබොඩුව මහතාය
(3) හීන් නිලමේ මහතාය
(4) සුරඹා ගුරුන්නාන්සේ ය

(40) වෙස් ඇඳුම් කට්ටලයේ කෙයිමෙත්ත හා අවුල් හැරය පළඳිනු ලබන්නේ,

(1) මැණික් කටුව අසලට හා පපුවට
(2) උරහිසට හා හිසට
(3) දෑතේ ඉහළට හා පපුවට
(4) ඉනට හා පපුවට

## III කොටස - පහතරට නර්තනය

(31) ''ගුහිතිගදිරිකිට ගුද ගුද ගුදිත ගුදිත්තක්'' යනු,

(1) හය වන ඉලංගම් සරඹයේ ඉරට්ටියය.
(2) අට වන ඉලංගම් සරඹයේ ඉරට්ටියය.
(3) නම වන ඉලංගම් සරඹයේ ඉරට්ටියය.
(4) දහ වන ඉලංගම් සරඹයේ ඉරට්ටියය.

(32) ''තකදිත් තකදොම් දොං දිං...'' මෙම පදයෙහි ඉතිරි කොටස වන්නේ,

(1) තරිකිට
(2) ගුහිතිගදිරිකිට
(3) තකදොං
(4) දිරිකිට තරිකිට

(33) නාතිලිංචිතාලය සිංදු වන්නමට අයත් බෙරපදය දැක්වෙන වරණය තෝරන්න.

(1) දොම් තම් ගත ගදිතම් ගත .....
(2) තක දික් තක දොම් .....
(3) රෙගුද ගතකු දොම් .....
(4) දිත්තම් දිතම් .....

(34) ගුද ගතිගත වට්ටමේ තාලරූපය වන්නේ,

(1) 2+2+4 තාලය
(2) 3+3+4 තාලය
(3) 2+2 තාලය
(4) 2+4 තාලය

(35) ''තත් ............. දිත් දත් .................'' යන්නෙහි හිස්තැනට ගැලපෙන පද කොටස් තෝරන්න.

(1) ගුදගත - තෙයි
(2) තරිකිට - තෙයි
(3) ගුහිතිගදිරිකිට - තා
(4) දොමිකිට - තෙයි

(36) පහතරට බෙරයේ වාදනය කරන පළමු හා දෙවන බෙර සරඹ පද වන්නේ,

(1) දිරිකිට - තරිකිට
(2) ගුහිති ගහිති- ගුහිතිගදිරිකිට
(3) ගුහිති - ගහිති
(4) රෙගුද - ගතකු

(37) මාත්‍රා 2+4 දෙතිතට අයත් ඉරට්ටිය ඇතුළත් වරණය කුමක්ද?

(1) ගුංද ගත්ගත ගත්ත ගුග්ගුද (2) තකදිමි ගත දොම් කිත්තත් කිටිතකක
(3) දොම් තත් දිමිගත ගුගුදිත (4) ගුංදත් ගුහිතිගදිරිකිට ගතගත///තා

(38) ''සිරිසඳ වනැති සිරිකත සමගිව වෙසෙනා'' මෙහි අවසන් කවි පදය තෝරන්න.

(1) සිරිලක පවර දෙවි නුවරෙහි වෙසෙසවනා
(2) සුරිඳුනි අසනු ම කියන බස් බැති පෙමිනා
(3) සිරිලක වසැති සිරි සැප සිරි සුව විඳිනා
(4) සිරි පිරි ගිරි මුදුනත සුරපුර ලෙසිනා

(39) ශාන්ති කර්ම වලට පමණක් සීමා වී පැවති පහතරට නර්තනය ප්‍රසංග වේදිකාවට ගෙන ඒමේ ගෞරවය හිමිවන්නේ,

(1) කේ. එස්. ප්‍රනාන්දු මහතාටය. (2) ගෝමිස් සිල්වා මහතාටය.
(3) ඒඩ්වින් ප්‍රනාන්දු මහතාටය. (4) විල්සන් ඔලබොඩුව මහතාටය.

(40) තෙල්මේ ඇඳුම් කට්ටලයේ අත් පටි හා නළල් පටිය පළඳිනු ලබන්නේ,

(1) මැණික් කටුව අසලට හා නළලට (2) දැතේ ඉහළ කොටස හා නළලට
(3) මැණික් කටුව අසලට හා හිසට (4) දෑතේ ඉහළ කොටසට හා හිසට

## IV කොටස - සබරගමු නර්තනය

(31) ''කිත්තා කිත්තා ජෙජ් ජෙං තා, තක්කඩ තරිකිට // ජෙජ් ජෙංතා'' මෙය,

(1) හත් වන දොඹින පදයයි
(2) අට වන දොඹින පදයයි
(3) නම වන දොඹින පදයයි
(4) දහ වන දොඹින පදයයි

(32) ''ජිං කිටිතත්....'' මෙම බෙර පදයේ හිස්තැනට ගැලපෙන පදකොටස වනුයේ,

(1) ජිං කුංතක (2) තත් කුඳිගත
(3) තත් කිටිතක (4) තතක තකුද

(33) ''කුද කුද ගත /// තතත් තා'' මෙම කලාසම අයත් වන්නම වනුයේ,

(1) කොවුලා වන්නම (2) මණ්ඩුක වන්නම
(3) විරාඩි වන්නම (4) අනිලා වන්නම

(34) පට්ටුතාල් මාත්‍රයේ තාල රූපය වනුයේ,

(1) මාත්‍රා 2+2+3 (2) මාත්‍රා 4+4
(3) මාත්‍රා 3+2+2 (4) මාත්‍රා 2+2

(35) ''තාත් ............. තකට ............'' යන අඩව්වේ හිස්තැනට ගැලපෙන පද කොටස් වනුයේ,

(1) තජ්ජිත් - තජ්ජිත් (2) තජ්ජිත් - කුංදත්
(3) කුංදත් - ජෙංතා (4) ජෙංතත් - තජ්ජිත්

(36) පළමුවන හා දෙවන දවුල් සරඹ වනුයේ,

(1) තකට - ජිකට
(2) තකට - තකටජිකට
(3) තක්කඩ - ජික්කඩ
(4) තරිගු - තකට

(37) මාත්‍රා 3+4 දෙතිතට අයත් අඩව්වක් ඇතුලත් වරණය කුමක්ද?

(1) ගත් තකු ජිත්තත් දොංකඩ තරිකිට
(2) තත් කිටහර් ජිත් කිට කුං
(3) ගත් තත් ගදිත ගත දොං
(4) තාත් තජ්ජිත් තකට තජ්ජිත්

(38) ''රිටු විමනා බිජුලමිනා..'' මෙම කවි පදයේ ඊළග කොටස වනුයේ,

(1) ඉසි වඩනා රිටු නොමිනා
(2) බහු නදනා රැකෙන මෙනා
(3) මියුරු මනා දළු සවනා
(4) මෙම හටනා ලොව තිබෙනා

(39) පහන් මඩු ශාන්ති කර්මයේ නාට්‍යමය පෙළපාලියක් වන්නේ,

(1) රාමා මැරීම
(2) මුදුන් තාලය
(3) යහන් දැක්ම
(4) හළඹ වැඩමවීම

(40) පබළු ඇඳුම් කට්ටලයට අයත් කොටස් ඇතුලත් වරණය වන්නේ,

(1) හැඩ කැල්ල, අත්පොට හතර
(2) කාගුල, හැඩ කැල්ල
(3) නළල් පටිය, ඉණ හැඩය
(4) ඉණ හැඩය, කාගුල්